20-07-2016

මීගමුව අධ්‍යාපන කලාපය
**දෙවන වාර ඇගයීම - 2016**
**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

විභාග අංකයඃ ..................................................

| 11 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01 යි. |
|---|---|---|

**සැලකිය යුතුයි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගන්න.
- පහත සිද්ධි ඇසුරින් ප්‍රශ්න අංක 01 සිට 04 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ඔබගේ එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා හා වුවමනා සඳහා වූ බොහෝ දෑ ව්‍යාපාරය විසින් සපයනු ලබන භාණ්ඩ හා සේවා මගින් සපුරා ගැනේ. බොහෝ ව්‍යාපාර කටයුතු කරන්නේ ලාභ ඉපයීමේ අපේක්ෂාවෙන් වුව ද, ඇතැම් ව්‍යාපාර ලාභ ඉපයීමේ අපේක්ෂාවෙන් තොරව කටයුතු කරයි."

01. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ව්‍යාපාර යන්න නිර්වචනය කිරීමට වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) ලාභ ලැබීමේ අරමුණෙන් කරන ඕනෑම කටයුත්තකි.
(2) මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි.
(3) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමේ ඕනෑම කටයුත්තකි.
(4) පුද්ගලයින් දෙදෙනෙකු විසින් ඇති කර ගන්නා ගිවිසුමකි.

02. මිනිස් වුවමනා පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) වෛද්‍යවරු, බෙහෙත්, රෝහල්
(2) වෑන් රථ, ප්‍රවාහන, දුම්රිය
(3) නැටුම්, ගැයුම්, විනෝදාස්වාදය
(4) ආහාර, සන්නිවේදනය, ඇඳුම්

03. අවශ්‍යතා හා වුවමනාවල ලක්ෂණ පිළිවෙළින් දැක්වෙන පිළිතුර වනුයේ,
(1) අසීමිත වීම හා සීමිත වීම.
(2) නිර්මාණය කළ නොහැකි වීම හා සංකීර්ණ වීම.
(3) සීමිත වීම හා පොදු වීම.
(4) විවිධ වීම හා පොදු වීම.

04. සේවා සැපයීමේ ව්‍යාපාර ලෙස සැලකිය නොහැක්කේ,
(1) අධ්‍යාපන ආයතන
(2) රූපලාවණ්‍ය ආයතන
(3) රක්ෂණ ආයතන
(4) සපත්තු නිෂ්පාදන ආයතන

05. නිෂ්පාදන සාධක පමණක් පිළිවෙළින් පෙළගැස් වූ විට නිවැරදි පිළිතුර වනුයේ,
(1) ඉඩම්, වැටුප්, ප්‍රාග්ධනය, ව්‍යවසාය
(2) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය
(3) ඉඩම්, වැටුප්, ප්‍රාග්ධනය, ලාභය
(4) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ලාභය

06. ව්‍යාපාරිකයෙකුට පහසුවෙන් පාලනය කළ හැකි පරිසරය වනුයේ,

(1) බාහිර පරිසරය (2) ආර්ථික පරිසරය

(3) තාක්ෂණික පරිසරය (4) අභ්‍යන්තර පරිසරය

07. සේවක ආකල්ප වර්ධනය සඳහා ව්‍යාපාරය විසින් පැවැත්වූ වැඩමුළුව, එහි සේවකයින් සාර්ථකව නිම කිරීම ව්‍යාපාරයට,

(1) ශක්තියකි. (2) තර්ජනයකි.

(3) අවස්ථාවකි. (4) දුර්වලතාවකි.

08. යූරෝ, පවුම්, යෙන් යන මුදල් ඒකක භාවිත වන රටවල් පිළිවෙළින් දක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) යුරෝපා ආර්ථික හවුල, බ්‍රිතාන්‍යය, ජපානය

(2) ජපානය, බ්‍රිතාන්‍යය, යුරෝපා ආර්ථික හවුල

(3) බ්‍රිතාන්‍ය, යුරෝපා ආර්ථික හවුල, ජපානය

(4) යුරෝපා ආර්ථික හවුල, චීනය, ජපානය

09. වර්තමානයේ පවත්නා ඇමරිකානු ඩොලරය විනිමය අගය, ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්න වශයෙන් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) රු. 75 යි. (2) රු. 110 යි.

(3) රු. 145 යි. (4) රු. 175 යි.

10. නෛතික පුද්ගලභාවයක් ඇති, ව්‍යාපාර සංවිධාන වර්ගයක් වනුයේ,

(1) හවුල් ව්‍යාපාරය (2) සංස්ථාපිත සමාගම්

(3) සමූපකාර (4) ඒක පුද්ගල ව්‍යාපාර

11. ආසිරි සැලූන්, වරාය අධිකාරිය, තරුණ බෞද්ධ සමිතිය යන ව්‍යාපාර අයත් ව්‍යාපාර සංවිධාන පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) හවුල් ව්‍යාපාර, සංස්ථා, සමිති සංවිධාන

(2) ඒක පුද්ගල ව්‍යාපාර, සංස්ථා, සමිති සංවිධාන

(3) ඒක පුද්ගල ව්‍යාපාර, දෙපාර්තමේන්තු, සමිති සංවිධාන

(4) සමූපකාර, සංස්ථා, සමිති සංවිධාන

12. පහත දක්වෙන ප්‍රකාශවලින් හවුල් ව්‍යාපාර සම්බන්ධ **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) හවුල් ව්‍යාපාරයක අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

(2) නෛතික පුද්ගල භාවයක් නොමැති වීම.

(3) හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම.

(4) ආරම්භ කිරීම සඳහා ලිඛිත ගිවිසුමක් අනිවාර්යෙන් ම තිබිය යුතු වීම.

13. හිමිකාරිත්වය යටතේ ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී පෞද්ගලික අංශයට අයත් නොවන ව්‍යාපාර සංවිධාන වර්ගයක් වනුයේ,

(1) සමිති සංවිධානය (2) සංස්ථාපිත සමාගම්

(3) සමූපකාර සමිති (4) රාජ්‍ය සංස්ථා

14. ව්‍යාපාර සංවිධානයක් වශයෙන් දෙපාර්තමේන්තු කළමනාකරණය හා පරිපාලනය සිදු කරනු ලබන්නේ,

(1) රජය විසිනි. (2) සේවකයින් විසිනි.
(3) දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසිනි. (4) විෂය භාර ඇමති විසිනි.

15. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ව්‍යාපාරයක සිදු වූ අතීත ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස වත්කම් ජනිත වේ.
(2) ආදායමින් වියදම් අඩු කළ පසු ලාභය ලැබේ.
(3) වගකීම් ප්‍රධාන වර්ග දෙකකට බෙදිය හැකිය.
(4) ලැබූ ගෙවල් කුලී ආදායම්, ව්‍යාපාරයේ වත්කමක් වේ.

16. ව්‍යාපාරයේ ගිණුම් පොත්වල සටහන් කළ නොහැකි, ව්‍යාපාර ගනුදෙනුවක් වනුයේ,

(1) රු. 20 000 ක භාණ්ඩ තොගයක් විනාශ වීම.
(2) රු. 100 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
(3) ව්‍යාපාරය සඳහා රු. 300 000 ක් පමණ වටිනා ගොඩනැගිල්ලක් තෝරා ගැනීම.
(4) රු. 50 000 ක ලැබිය යුතු ණය මුදලක් බොල්ණය බවට පත් වීම.

17. අයිතිකරු, තම ව්‍යාපාරයට රු. 50 000 ක බැංකුණයක් ලබා ගැනීම, ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය නිවැරදිව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යාපාරයේ වත්කම් මෙන්ම, හිමිකම් ද වැඩි වේ.
(2) ව්‍යාපාරයේ වත්කම් මෙන්ම, හිමිකම් ද අඩු වේ.
(3) ව්‍යාපාරයේ වගකීම් මෙන්ම, වත්කම් ද වැඩි වේ.
(4) ව්‍යාපාරයේ වගකීම් මෙන්ම, වත්කම් ද අඩු වේ.

18. පහත දැක්වෙන සමීකරණවලින් නිවැරදි ගිණුම්කරණ සමීකරණය කුමක් ද?

(1) හිමිකම් - වගකීම් = වත්කම් (2) හිමිකම් - වත්කම් + වගකීම්
(3) වත්කම් - වගකීම් = හිමිකම් (4) වගකීම් - හිමිකම් + ජංගම වත්කම්

19. ව්‍යාපාරයේ පොදු ලෙජරයෙන් දැක්වෙන ලෙජර් ගිණුම් 'X' තීරුවේ ද, ගනුදෙනු සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන් මූලධර්මය 'Y' තීරුවේ ද දැක්වේ.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. ගොඩනැගිලි ගිණුම | A. වැඩිවීම හර, අඩුවීම බැර |
| 2. විකුණුම් ගිණුම | B. අඩුවීම හර, වැඩිවීම බැර |
| 3. ණය හිමි ගිණුම | C. අඩුවීම හර, වැඩිවීම බැර |

X තීරුවේ සටහන් ලෙජර් ගිණුම්, Y තීරුවේ සඳහන් ද්විත්ව සටහන් මූලධර්මය සමඟ ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) C B A (2) B C A
(3) B A C (4) A C B

20. බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කිරීමට උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛනයක් වනුයේ,

(1) හර පත (2) බැර පත
(3) ජ'නල් වවුචරය (4) ගෙවීම් වවුචරය

21. ව්‍යාපාරයක බැංකු ගිණුමේ බැර ශේෂය,

(1) වත්කමකි. (2) වගකීමකි.

(3) ආදායමකි. (4) වියදමකි

22. ව්‍යාපාරයක සුළු මුදල් භාරකරු එක්තරා මාසයක් අවසානයේ දී රු. 1750 ක් වියදම් කර තිබූ අතර, ඔහු සතුව රු. 250 ක් ඉතිරි වී තිබුණි. ඉදිරි මාසය සඳහා අදාළ දිනයේ දී රු. 1750 ක් ප්‍රතිපූර්ණය කරන ලදී. මෙම ව්‍යාපාරයේ මාසික සුළු මුදල් අග්‍රිමය කොපමණ ද?

(1) රු. 1750 (2) රු. 250

(3) රු. 2000 (4) රු. 1650

23. ස්ථාවර නියෝග මත, බැංකුව විසින් කළ ගෙවීම් ව්‍යාපාරයේ සටහන් කරනුයේ එහි,

(1) බැංකු ගිණුමෙහි හරට ය. (2) බැංකු ගිණුමෙහි බැරට ය.

(3) මුදල් පොතෙහි හරට ය. (4) මුදල් පොතෙහි බැරට ය.

24. "ණය ගැතියෙකුගෙන් ලැබී බැංකුවේ තැන්පත් කළ චෙක්පතක් අගරු වූ බව බැංකුව දැනුම් දෙන ලදී." මෙහි දී අගරු වූ චෙක්පතෙහි අගය සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන වනුයේ,

(1) ණය ගැති ගිණුම හර, බැංකු ගිණුම බැර

(2) අගරු වූ චෙක්පත් ගිණුම හර, බැංකු ගිණුම බැර

(3) බැංකු ගිණුම හර, ණය ගැති ගිණුම බැර

(4) අගරු වූ චෙක්පත් ගිණුම හර, ණය ගැති ගිණුම බැර

25. පහත සඳහන් ගනුදෙනු අතුරෙන්, විකුණුම් ජ'නලයේ සටහන් කරන ගනුදෙනුව වනුයේ,

(1) රු. 10 000 ක වෙළෙඳ බඩු තොගයක් මුදලට විකිණීම.

(2) රු. 10 000 ක වෙළෙඳ බඩු තොගයක් ණයට විකිණීම.

(3) රු. 50 000 ක කාර්යාල උපකරණ මුදලට විකිණීම.

(4) රු. 50 000 ක කාර්යාල උපකරණ ණයට විකිණීම.

26. සීමිත අමන්ද සමාගමේ ගිණුම් ලිපිකරු විසින් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා කාර්යාලයීය ලියන මේසයක් ණයට ගෙන ඇත. මෙම ගනුදෙනුව සටහන් කළ යුතු මූලික සටහන් පොත කුමක් ද?

(1) පොදු ජ'නලය (2) ගැනුම් ජ'නලය

(3) විකුණුම් ජ'නලය (4) මුදල් පොත

27. ගිණුම් කාල සීමාවක් තුළ දී ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුව මූලික සටහන් පොත්වල සටහන් කිරීමෙන් පසු සටහන් කළයුතු වනුයේ,

(1) ශේෂ පිරික්සුමේ ය. (2) ලෙජරයේ ය.

(3) මූලාශ්‍ර ලේඛනවල ය. (4) මුදල් පොතේ ය.

28. රක්ෂණ ගාස්තු වියදම් රු. 500ක් එම ගිණුමේ අඩුවෙන් එකතු කිරීම නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් වනුයේ,

(1) අවිනිශ්චිත ගිණුම හර 500
රක්ෂණ ගාස්තු ගිණුම බැර 500

(2) රක්ෂණ ගාස්තු ගිණුම හර 500
මුදල් ගිණුම බැර 500

(3) අවිනිශ්චිත ගිණුම හර 500
ගෙවිය යුතු රක්ෂණ ගාස්තු ගිණුම බැර 500

(4) රක්ෂණ ගාස්තු ගිණුම හර 500
අවිනිශ්චිත ගිණුම බැර 500

20 · 07 · 2016

11 ශ්‍රේණිය.

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍ය.

REFERENCE ONLY

29. ගිණුම්කරණයේ දී සිදු වූ වැරදි කිහිපයක් පහත දැක්වේ.

A - රු. 10 000 ක දුරකථන ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් වීම.

B - රු. 10 000 ක ගැනුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වල දෙවරක් සටහන් වීම.

C - ගොඩනැගිලි කුලී ගෙවීම රු. 5 000 ක් ගොඩනැගිලි කුලී ගිණුමට බැර කිරීම.

ඉහත වැරදි අතුරෙන් ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව අතර වෙනසක් ඇති කරන වැරදි වනුයේ,

(1) A හා B ය. (2) A හා C ය.

(3) B හා C ය. (4) B ය.

30. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම සිල්ලර වෙළඳාමයි.

(2) සුපිරි වෙළෙඳසැල්, ස්ථාවර සුළු පරිමාණ වෙළෙඳසැලකට නිදසුනකි.

(3) වෙළඳාම දේශීය හා විදේශීය වශයෙන් දෙයාකාර වේ.

(4) නැවත විකිණීමේ අරමුණින් නිෂ්පාදිත මිල දී ගැනීම තොග වෙළඳාමයි.

31. වාණිජ බැංකු සෙසු මූල්‍ය ආයතනවලින් වෙනස්වන ප්‍රධානතම සාධකයක් වනුයේ,

(1) තැන්පත් ගිණුම් පවත්වාගෙන යාම නිසා ය.

(2) ව්‍යාපාරික සේවා සැපයීම නිසා ය.

(3) ජංගම ගිණුම් පවත්වාගෙන යාම නිසා ය.

(4) විදේශ විනිමය ගනුදෙනු පවත්වාගෙන යාම නිසා ය.

32. ජීවිත රක්ෂණ සඳහා අදාළ නොවන රක්ෂණ මූලධර්මය වනුයේ,

(1) රක්ෂණ හිමිකම (2) උපරිම විශ්වාසය

(3) හානි පූර්ණය (4) ආදේශනය

33. විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) මුහුණුපොත (face book) / ස්කයිප් (Skype) / සීනුව

(2) දැන්වීම් පුවරු/මාර්ග සංඥා/වෙබ් අඩවි

(3) මාර්ග සංඥා/පිළිගත් සංකේත/ඩිජිටල් පුවරු

(4) අන්තර්ජාලය/වෙබ් අඩවි/ඩිජිටල් පුවරු

34. සන්නිවේදනය යනු ක්‍රියාවලියකි, එම ක්‍රියාවලියට ඇතුළත් මූලිකාංගයක් වනුයේ,

(1) වේගයයි. (2) පිරිවැයයි

(3) ප්‍රතිචාරයයි (4) නිවැරදි බවයි

35. ප්‍රවාහන ක්‍රියාවලියට අයත් මූලිකාංග වනුයේ, මාර්ගය, මාධ්‍යය, .................

(1) මහා මාර්ග හා බලයයි. (2) බලය හා පර්යන්තයයි.

(3) ප්‍රවාහනය හා පර්යන්තයයි. (4) ප්‍රවාහනය හා බලයයි.

36. .........1......... , .........2......... , මෙහෙයවීම හා පාලනය කළමනාකරණ මූලිකාංග වේ.

ඉහත ප්‍රකාශයේ අංක 1 හා 2 යන ස්ථානවලට අදාළ යෙදුම් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සැලසුම්කරණය, සංවිධානය (2) සංවිධානය, සැලසුම්කරණය

(3) අරමුණ පිහිටුවීම, තීරණ ගැනීම (4) සැලසුම්කරණය, තීරණ ගැනීම

37. බෙදා හැරීමේ වියදම් හා පරිපාලන වියදම් පමණක් පිළිවෙළින් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) විදුලි ගාස්තු, රක්ෂණ ගාස්තු, ප්‍රචාරණ වියදම්, දුන් වට්ටම්

(2) බැංකු ණය පොලී, බැංකු ගාස්තු, ප්‍රචාරණ වියදම්, බොල් ණය

(3) බොල් ණය, ප්‍රචාරණ වියදම්, රක්ෂණ ගාස්තු, විදුලි ගාස්තු

(4) දුරකථන ගාස්තු, බැංකු ගාස්තු, රක්ෂණ ගාස්තු, රථ වාහන ක්ෂය

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අමන්දගේ ව්‍යාපාරයේ 2015.12.31 දිනට පොත්වලින් උපුටාගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ගැනුම් | 40 000 |
| විකුණුම් | 80 000 |
| ගෙන ඒමේ කුලී | 9 500 |
| පැටවුම් කුලී | 7 000 |
| රක්ෂණ ගාස්තු වියදම් | 2 000 |
| ප්‍රචාරණය | 1 000 |
| 2015.01.01 ඉතිරි බඩු තොගය | 15 000 |
| 2015.12.31 ඉතිරි බඩු තොගය | 20 000 |

38. මෙම ව්‍යාපරයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය කොපමණ ද?

(1) රු. 64 500 (2) රු. 71 500

(3) රු. 51 500 (4) රු. 20 000

39. මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ විකුණුම් පිරිවැය කොපමණ ද?

(1) රු. 44 500 (2) රු. 51 500

(3) රු. 50 000 (4) රු. 50 500

40. මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ දළ ලාභය කොපමණ ද?

(1) රු. 40 000 (2) රු. 48 500

(3) රු. 20 500 (4) රු. 28 500

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2016
## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

විභාග අංකය: ..............................

| 11 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 02 යි. |
|---|---|---|

- පළමුවන ප්‍රශ්නය ඇතුලුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් සිද්ධිය උපයෝගි කර ගනිමින් අංක (i) සිට (iv) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අසිත වරලත් ගණකාධිකාරිවරයෙකි. ඔහු තවත් වරලත් ගණකාධිකාරිවරුන් දෙදෙනෙකු සමග එක් වී "සී.ජී.සී ආදායම් බදු උපදේශකයෝ" නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම හවුල, ලිඛිත හවුල් ගිවිසුමක් යටතේ පවත්වාගෙන යනු ලැබේ. ව්‍යාපාරික ගනුදෙනු ලංකා බැංකුවේ ජංගම ගිණුමක් හරහා පවත්වාගෙන යාමට තීරණය විය. වසර දෙකකින් පසුව ව්‍යාපාරයේ ඉලක්ක සපුරා ගත්තේ නම් ව්‍යාපාරය සීමිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කර ගැනීමට ද අපේක්ෂිත ය.

(i) (අ) අරමුණු අනුව වර්ග කළහොත් මෙම හවුල් ව්‍යාපාරය අයත් වන්නේ කුමන වර්ගයට ද?

(ආ) හවුල් ව්‍යාපාරවල දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) හවුල් ව්‍යාපාරයක් ලිඛිත ගිවිසුමක් යටතේ පවත්වාගෙන යාමේ වාසි දෙකක් ලියන්න.

(iii) මෙම ව්‍යාපාරය සාර්ථක වීමට හේතු විය හැකි සාධක දෙකක් මෙම සිද්ධිය ඇසුරින් ගෙන හැර දක්වන්න.

(iv) (අ) මෙම ව්‍යාපාරය පෞද්ගලික සමාගමක් බවට පත්කර ගතහොත් අත්කර ගත හැකි වාසි දෙකක් ලියන්න.

(ආ) වානිජ බැංකුවක ජංගම ගිණුමක් ආරම්භ කිරීම මගින් මෙම ව්‍යාපාරයට ලබා ගත හැකි ප්‍රතිලාභ දෙකක් ලියන්න.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක (v) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගැනුම් ජ'නලය

| දිනය | ඉන් අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම රු. | ලෙජර් පිටුව |
|---|---|---|---|---|
| 2016. 03. 01 | 115 | A නාමල් | 22 000 | |
| 2016. 03. 04 | 65 | සහන් | 20 000 | |
| 2016. 03. 15 | 43 | පියල් | 18 000 | |
| 2016. 03. 31 | | B ගැනුම් ගිණුම හර කළා | 60 000 | |

(v) මෙහි ගනුදෙනු සටහන් කිරීමට උපයෝගී කර ගත් මූලාශ්‍ර ලේඛනය කුමක් ද?

(vi) මූලාශ්‍ර ලේඛනවල සාමාන්‍යයෙන් සඳහන් වන කරුණු දෙකක් ලියන්න.

(vii) ගැනුම් ජ'නලයේ සඳහන් මෙම ගනුදෙනු ලෙජරයට පිටපත් කරන්න.

(viii) පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනු වර්ග දෙකක් ලියන්න.

(ix) (අ) ලෙජරයේ ඇති ගිණුම් වර්ග පහ සඳහන් කරන්න.

(ආ) ඉහත ගැනුම් ජ'නලයේ A හා B ලෙස නම් කර ඇති එක් එක් ගිණුම් අයත් ගිණුම් වර්ගය ලියන්න.

(x) සුළු මුදල් අග්‍රිම ක්‍රමය අනුව, ප්‍රතිපූර්ණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 02 x 10 = 20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

02. (i) ඔබගේ අවශ්‍යතා හතරක් සඳහන් කර, ඔබ සඳහන් කළ අවශ්‍යතා සපුරා ගන්නා ආකාරය (වුවමනා) ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කළ හැකි දෙයාකාරය කවරේ ද?

(ආ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම් දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශන **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන විවිධ පාර්ශව කොටස්කරුවන් වේ.

(ආ) ස්වභාවධර්මයෙන් ලැබී ඇති සියලු සම්පත් භූමිය යනුවෙන් හැඳින්වේ.

(ඇ) තරඟකරුවන් බිහිවීම ව්‍යාපාරයකට ඇති ශක්තියක් ලෙස දැක්විය හැකි ය.

(ඈ) රියදුරු පුහුණු පාසල සේවා සපයන ව්‍යාපාරයකි. (ලකුණු 02 යි)

(iv) "ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් වර්ග කළ හැකි ය."

අභ්‍යන්තර පරිසරයෙන් හඳුනාගත හැකි ශක්තීන් දෙකක් ද, බාහිර පරිසර අධ්‍යයනයෙන් හඳුනාගත හැකි අවස්ථා දෙකක් ද සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08)

03. (i) (අ) සිල්ලර වෙළෙන්දා විසින් පාරිභෝගිකයාට සපයන සේවා දෙකක් සඳහන් කරන්න.

(ආ) "වෙළෙඳපොළ ප්‍රසාරණය හා තරඟකාරිත්වය නිසා වෙළෙඳපොළ තුළ විෂමචාර ඇති වේ." එසේ ඇති විය හැකි විෂමචාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශන **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) පූජා භූමියක් අසල වන්දනාකරුවන්ට මල් අලෙවි කිරීම සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයකට නිදසුනකි.

(ආ) අවසාන පරිභෝජනය සඳහා පාරිභෝගිකයින්ට භාණ්ඩ හා සේවා විකිණීම තොග වෙළෙඳාම වේ.

(ඇ) චෙක්පත් මගින් ගනුදෙනු කිරීමට බැංකු ජංගම ගිණුමක් අවශ්‍ය නොවේ.

(ඈ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. (ලකුණු 02 යි)

(iii) (අ) චෙක්පතට සම්බන්ධ පාර්ශව නම් කරන්න.

(ආ) චෙක් පත් ලිවීමේ දී සැලකිලිමත් වන කරුණු දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(iv) ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් යොදා ගැනීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08)

04. (i) කමල් තම ව්‍යාපාරික ගොඩනැගිල්ල ප්‍රභාත් රක්ෂණ සමාගමේ රු. 100 000 කට ද, සමීර රක්ෂණ සමාගමේ රු. 400 000 කට ද, රක්ෂණය කර ඇත. ඔහුගේ මෙම ගොඩනැගිල්ලට රු. 100 000 ක හානියක් විය.

(අ) මෙම වන්දිය ගෙවීමේ දී සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන රක්ෂණ මූලධර්මයක් ලියන්න.

(ආ) ශ්‍රී ලංකාවේ ඇති රක්ෂණ ආයතන දෙකකට නිදසුන් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) වාර්ෂික සංවත්සරික පාසල් සංවර්ධන සමිතියට සියලු ම සිසුන්ගේ දෙමාපියන් වෙත සමිතියට පැමිණෙන ලෙස දන්වමින් පාසලේ විදුහල්පතිතුමා විසින් ලිපියක් යවන ලදී. ඉහත සන්නිවේදන ක්‍රියාවලියට අදාළ යවන්නා, පණිවුඩය, මාධ්‍යය හා ලබන්නා පිළිවෙළින් ලියන්න. (ලකුණු 02 යි)

(iii) නඩරාජා යාපනෙන් කෙසෙල් මිළ ට ගෙන කොළඹ මැනිං වෙළෙඳපොළට බෙදා හැරීමේ ව්‍යාපාරයක නිරතව සිටියි.

(අ) මෙම ව්‍යාපාරය සඳහා නඩරාජා විසින් යොදා ගත යුතු වඩාත් සුදුසු ප්‍රවාහන මාර්ගයක් හා ඊට අදාළ මාධ්‍යය සඳහන් කරන්න.

(ආ) ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන දෙකකට නිදසුන් දක්වන්න. (ලකුණු 02 යි)

(iv) (අ) කළමනාකරණය යනු කුමක් ද?

(ආ) අලෙවිකරණ මිශ්‍රණයට අයත් විචල්‍යයන් දෙකක් ලියන්න.

(ලකුණු 02 යි)

(මුළු ලකුණු = 08)

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න)

05. (i) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| | වත්කම් | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (අ) | + 50 000 | | | | + 50 000 |
| (ආ) | + 30 000<br>- 30 000 | | | | |
| (ඇ) | - 5000 | | -5000 | | |
| (ඈ) | +10 000 | | + 10 000 | | |
| (ඉ) | -15 000 | | | | -15 000 |

ඉහත එක් එක් අවස්ථාවල සිදු වූ ගනුදෙනුව අගයන් සහිතව ලියන්න. (ලකුණු 05 යි)

(ii) 2016.04.01 දිනට අභිංසකගේ බැංකු ගිණුමේ තිබූ ශේෂය රු. 10 000 කි. අප්‍රේල් මාසය තුළ දී ඔහුගේ බැංකු ජංගම ගිණුම සමග කළ ගනුදෙනු පහත දක්වේ.

2016. 04. 02 ණය ගැතියන්ගෙන් ලැබී තිබුණු රු. 1 00 000 ක චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම.

04. 04 විකුණුම්වලින් ලැබී තිබුණු රු. 12 000 ක චෙක්පත එම අවස්ථාවේ දී ම බැංකුවේ තැන්පත් කිරීම.

04. 12 මුදල් රු. 15 000 ක් බැංකු ජංගම ගිණුමේ තැන්පත් කිරීම.

04. 13 ණයහිමියන්ට රු. 5 000 ක් චෙක්පතකින් ගෙවීම.

04. 15 විදුලි වියදම් සඳහා රු. 5 000 ක් චෙක් පතකින් ගෙවීම.

04. 20 රු. 10 000 ක චෙක්පතක් ණය ගැතියන්ගෙන් ලැබීම.

04. 25 රු. 15 000 ක් බැංකු ජංගම ගිණුමේ තැන්පත් කිරීම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත සඳහන් ගනුදෙනු බැංකු ගිණුමේ සටහන් කොට එය තුලනය කිරීම.

(ආ) අදාළ අනෙකුත් ලෙජර් ගිණුම්වල පිටපත් කිරීම. (ලකුණු 07 යි)

(මුළු ලකුණු 12 )

06. (i) සඳරුවන්ගේ ව්‍යාපාරයේ 2016.01.31 දිනට බැංකු ගිණුමේ හර ශේෂය රු. 40 000 ක් විය. එහෙත් එදිනට බැංකු ප්‍රකාශයේ සඳහන් වටිනාකම එයට වෙනස් විය. වෙනසට හේතු වශයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

- රු. 1 000 ක බැංකු ගාස්තුවක් බැංකුව අය කරගෙන තිබුණි.
- නිකුත් කළ නමුත් මෙතෙක් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 4 000 කි.
- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 8 000 ක් විය.
- බැංකුව වෙත සෘජුවම ණය ගැතියන්ගෙන් ප්‍රේෂණය කර තිබූ මුදල රු. 6 000 කි.

අවශ්‍ය වන්නේ,

(අ) බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

(ආ) බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය යොදා ගනිමින් 2016.01.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙළ කිරීම. (ලකුණු 06 යි)

(ii) සුනන්දගේ ව්‍යාපාරය විසින් 2015.12.31 දිනෙන් අවසන් කරන ලද ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව සමාන නොවූ නිසා එම වෙනස වූ රු. 15 000 අවිනිශ්චිත ගිණුමේ හර ට සටහන් කරන ලදී. පසුව පහත සඳහන් වැරදි සොයා ගන්නා ලදී.

- රු. 10 000 ක ගැනුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වල දෙවරක් සටහන් වී ඇත.
- රු. 15 000 ක දුරකථන ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.
- රු. 10 000 ක් වූ ගොඩනැගිලි කුලී වියදම් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමේ සටහන් වී නැත.
- ණය ගැතියන්ගෙන් ලැබුණු රු. 5 000 ක් වූ මුදල මුදල් පොතට හර කර ණයගැති ගිණුමට ද හර කර ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්

(ආ) අවිනිශ්චිත ගිණුම පිළියෙළ කිරීම. (ලකුණු 06)

(මුළු ලකුණු 12)

20.07.2016
ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
REFERENCE ONLY

07. (i) (අ) ව්‍යාපාරයක දැකිය හැකි ජංගම නොවන වගකීමක් ලියන්න.

(ආ) ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී අදාළ කරගන්නා ගැළපුම් සටහන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) අමන්දගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2015. 12. 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

අමන්දගේ ව්‍යාපාරය

2015. 12. 31 දිනට ශේෂ පිරික්සුම

| ගිණුමේ නම | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| 2015.01.01 දිනට තොගය | 20 000 | |
| ගැනුම් | 50 000 | |
| විකුණුම් | | 120 000 |
| ණය ගැතියෝ | 30 000 | |
| 10% බැංකු ණය | | 15 000 |
| ණය හිමියෝ | | 50 000 |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | 200 000 | |
| යන්ත්‍ර හා උපකරණ | 200 000 | |
| පැටවුම් කුලී | 1 500 | |
| ගෙන ඒමේ කුලී | 3 000 | |
| ලැබූ ගෙවල් කුලී | | 8 000 |
| කඩ කුලී වියදම් | 4 000 | |
| රක්ෂණ ගාස්තු | 5 000 | |
| සේවක වේතන | 12 500 | |
| ප්‍රචාරණය | 2 000 | |
| අතැති මුදල් | 15 000 | |
| ප්‍රාග්ධනය (2015. 01. 01 දිනට) | | 350 000 |
| | 543 000 | 543 000 |

අමතරව තොරතුරු පහත දැක්වේ.

(i) 2015.12.31 දිනට ඉතිරි වෙළෙඳ බඩු තොගය රු. 25 000 යි.

(ii) 2015.12.31 දිනට උපචිත වියදම්

රක්ෂණ ගාස්තු රු. 1000

කඩකුලී වියදම් රු. 500

අවශ්‍ය වන්නේ,

(අ) 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය

(ආ) 2015.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(ලකුණු 10)

(මුළු ලකුණු 12)